


# ජීවිතයේ ගුණාත්මකභාවය

## ආර්ථික සහ සමාජ අයිතිවාසිකම් (2021)

සාරාංශ ලකුණු **81.6%**

ශ්‍රී ලංකාව සිය ආදායම් මට්ටමින් කළ හැකි දෑට සාපේක්ෂව කෙතරම් දුරට සාර්ථකත්වයක් අත්කරගෙන තිබේද?

ආදායමට අනුව සැකසූ මිනුම් ලකුණින් අත්කර ගත් ප්‍රතිශතය %




ශ්‍රී ලංකාව 'ආදායම අනුව සැකසූ' මිනුම් ලකුණට අනුව ලැබූ ලකුණු ප්‍රමාණය **81.6%** කි.

දකුණු ආසියාවේ අනෙකුත් රටවල් හා සැසඳූ විට, ශ්‍රී ලංකාවේ ජීවිතයේ ගුණාත්මකභාවය ගැන අයිතිවාසිකම් සම්බන්ධයෙන් **සාමාන්‍ය තත්වයට වඩා හොඳ තත්වයක්** ඇත. (මෙම සංසංදනය 'ආදායම අනුව සැකසූ' මිනුම් ලකුණට අනුව ගණනය කර ඇත).

# රාජ්‍යයෙන් ආරක්ෂාව

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් (2023)

සාරාංශ ලකුණු 5.4/10

ශ්‍රී ලංකා රජය එක් එක් අයිතිය කෙතරම් දුරට සුරකින්නේද?

ලකුණු




ශ්‍රී ලංකාවේ රාජ්‍යයෙන් ආරක්ෂාව පිළිබඳ ලකුණු මට්ටම **10න් 5.4** ක් වීමෙන් පෙනෙන්නේ අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම, වදහිංසාව සහ අවමන් සහගත ලෙස සැලකීම, බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම, මරණ දඬුවම, හෝ අධිකරණමය නොවන ඝාතන යන ඒවායෙන් එකක් හෝ කිහිපයක් නිසා, රටේ බොහෝ දෙනෙකු අනාරක්ෂිත බවයි.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් දකුණු ආසියානු රටවල කලාපීය සංසංදනයක් සඳහා ප්‍රමාණවත් දත්ත අප වෙත නොමැත. කෙසේ වුවත්, අපේ නියැදියේ ඇති අනෙකුත් රටවල් හා සංසංදනය කළ විට රාජ්‍යයෙන් ආරක්ෂාව පිළිබඳ අයිතීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ **සාමාන්‍ය තත්වයට වඩා පහළ තත්වයක්** ඇත.

HRMI Rights Tracker

# බලගැන්වීම

## සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් (2023)

සාරාංශ ලකුණු **3.4/10**

ශ්‍රී ලංකා රජය එක් එක් අයිතිය කෙතරම් දුරට සුරකින්නේද?




ශ්‍රී ලංකාවේ බලගැන්වීම පිළිබඳ ලකුණු මට්ටම **10න් 3.4** ක් වීමෙන් පෙනෙන්නේ, රටේ බොහෝ දෙනෙකු විසින් සිවිල් සහ දේශපාලනික නිදහස (භාෂණයේ නිදහස, එක්රැස්වීම සහ සමාගමය, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්, සහ ආගම සහ විශ්වාසය) භුක්ති විඳින්නේ නැති බවයි.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් දකුණු ආසියානු රටවල කලාපීය සංසංදනයක් සඳහා ප්‍රමාණවත් දත්ත අප වෙත නොමැත. කෙසේ වුවත්, අපේ නියැදියේ ඇති අනෙකුත් රටවල් හා සංසංදනය කළ විට බලගැන්වීමේ අයිතීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ **සාමාන්‍ය තත්වයට වඩා පහළ තත්වයක්** ඇත.

### රටේ විස්තර

**ජනගහණය**
මිලියන 22.2 (2022)

**ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය**

| | |
|---|---|
| $3,354 (2022)<br>වත්මන් එ.ජ. ඩොලර් | $12,200 (2022)<br>2017 ක්‍රය ශක්ති සාම්‍යය ඩොලර් |

**රටේ ලකුණු මට්ටම් ගැන වැඩි විස්තර විමසා බැලීමට කරුණාකර rightstracker.org වෙත යන්න.**